කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 02 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පල්ලේකැලේ ජනසවිගම නිවාස ව්‍යාපෘතියෙන් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණු ඉඩම් හෙක්ටයාර 1.044 ක් හා මිනුම් නොකල ඉඩම් 16 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ට්‍රැක්ටර් ට්‍රේලරයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොගය තුළ භෞතිකව නොතිබුණු රු.4,837,105 ක ජල කර්මාන්ත භාණ්ඩ තොගයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.130,000 ක් වටිනාකම වූ කොම්පෝස්ට් පොහොර ටොන් 26 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.3,574,595 ක ඉදිකිරීම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පුස්තකාල පොත්වල වටිනාකම රු.23,887 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඩ) මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවේ සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය හා ලැබිය යුතු පොලිය රු.1,006,849 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඪ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.4,379,100 ක් වටිනා යන්ත්‍ර හා ලී බඩු උපකරණ ගිණුම්ගතකර නොතිබුණි.

(ඵ) සමාලෝචිත වර්ෂය තුළ නොපියවූ අත්තිකාරම් රු.7,928,837 ක වටිනාකම තුළ අලුත්වත්ත කොම්පෝස්ට් අංගනය දීර්ඝ කිරීම සඳහා බිල්පත් ගෙවීම් රු.3,827,160 ක වටිනාකම ද ඇතුළත් කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.711,498 ක වටිනාකම ණයගැති වශයෙන් ගිණුම්ගතකර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී ඩිප්ලෝමා පාඨමාලාවකට ගෙවිය යුතු ගාස්තුව රු.45,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබුණු කසළ බදු රු.478,700 ක් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ක) කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභා දෙක ගිවිසුමක් යටතේ පවත්වාගෙන යන අලුත්වත්ත කොම්පෝස්ට් අංගනය යන ව්‍යාපෘතියේ ආදායම හා වියදම් සඳහා වෙනම ගිණුමක් පිළියෙළ නොකර සභාවේ ආදායම් හා වියදම් ගිණුම හර හා බැර කර තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

----------------------

මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධව ගොඩනැගිලි ඉදිකිරීම්, අනවසර ඉදිකිරීම් තහනම් කිරීම් හා මාර්ග සම්බන්ධයෙන් සභාවට විරුද්ධව පාර්ශවකරුවන් 17 දෙනෙකු නඩු 15 ක් ගොනුකර ඇතත්, ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.121,917,551 ක් වූ ගිණුම් විෂයයන් 6 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.73,541,203 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම

----------------------

ඉකුත් වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු අවිනිශ්චිත ගිණුමේ වූ රු.15,239 ක හර ශේෂයට වර්ෂය තුළ රු.20 ක් බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,219 ක හර ශේෂයක් විය. ඉකුත් වර්ෂයේද අවිනිශ්චිත ගිණුමේ ශේෂයට රු.143 ක් හර කර තිබුණු අතර, මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම්

---------------------

(i) සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.16,143,706 ක් වූ අතර, එම ශේෂය වසර 1 ක කාලයක් ඉක්මවා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මැණික්හින්න පොදු වෙළඳ සංකීර්ණයේ බිම් මහල කඩ කාමර 12 කින් හා පළමු මහල කඩ කාමර 10 කින් රු.82,067 ක හිඟ බදු මුදලක්ද, මැණික්හින්න නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 29 කින් රු.273,080 ක හිඟ බදු කුලියක් ද, මැණික්හින්න බස් නැවතුම්පල අසල කඩ කාමර 3 කින් රු.67,780 ක මුදලක් ද අයවිය යුතුව තිබුණි.

(iii) දිගන රණවිරු වීදියේ කඩ කාමර 86 කින් 2017 දෙසැම්බර් 15 දින වන විට රු.379,379 ක මුදලක් අය විය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතු වටිනාකම රු.88,489,658 ක් වූ අතර, එයින් වසර 1 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.64,044,492 ක් විය.

1.3.6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,924,075 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 අනුකූල නොවීම

1.3.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| | (i) 132 (ඒ) වගන්තිය | 110,000<br>24,570 | (i) දිගන ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම් උත්සවයේ තොරණ ඉදි කිරීම හා "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන හා මහවැලි අධිකාරියේ ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව වියදම් දරා තිබුණි. |
| | (i) 149 වගන්තිය | 14,462,640 | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වලින් අයකරන සියයට 1 ක බද්ද ගණනය කිරීමේදී හෝටලය මගින් ඉදිරිපත් කළ වාර්තාවක් මත ආදායම් ලබා ගැනීම හේතුවෙන් අයකර ගතහැකි ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි. |
| | (ii)1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23 (අ) වගන්තිය පරිදි අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය | 27,000 | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 9 ක් වෙත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සභා අරමුදලට අයවිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 104 | 1,272,790 | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් හෙළිදරව් වූ වටිනාකම හඳුනාගත් හා නොගත් භාණ්ඩ අයිතම 423 ක ඌනතාවයක් හා පුස්තකාල පොත් ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | - | 2017 වර්ෂය සඳහා තැන්පතු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් පියවන ලද ශේෂ, පියවිය යුතු ශේෂ හා ආදායමට ගත යුතු ශේෂ හඳුනා ගැනීමට නොහැකි විය. |
| (iii) මුදල් රෙගුලාසි 371 (4) | 450,450 | අතුරු අග්‍රිම ලබා ගැනීම අවශ්‍ය නොවන අවස්ථා 9 ක් සඳහා අතුරු අග්‍රිම ලබාගෙන තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 371 (5) | 210,000 | යොමුගත වගන්තිය ප්‍රකාරව ලබාගත් අතුරු අග්‍රිමයක් පියවා නොමැති නිලධාරියෙකුට එය පියවන තෙක් නැවත අතුරු අග්‍රිමයක් නිකුත් නොකළ යුතු වුවත්, අවස්ථා 5 කදී නිලධාරීන් 2 කට අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 371 (5) | 330,000 | අග්‍රිමය නිකුත් කරන මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර අග්‍රිම පියවිය යුතු වුවත්, පිළිවෙලින් 2016 හා 2017 වර්ෂවල ලබාදුන් අග්‍රිම 3 ක් හා 6 ක් පියවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| | (i) 2:11:3 | - | ටෙන්ඩර් රැස්වීම් වාර්තා ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියක වාර්තා කර පැමිණ සිටින සාමාජිකයන් අත්සන් කර නොතිබුණි. |
| | (ii) 2:8:1 (ආ) | 1,157,450 | පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා විෂය පිළිබඳ විශේෂඥයෙකු ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | |
| | (i) 3.2 (iv) වගන්තිය | | අනුමත සමිතිවලට ලබාදුන් කොන්ත්‍රාත්තු එම සමිති විසින් උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. |
| | (ii) 3.2 (i) , (ii), (iii) වගන්තිය | | ප්‍රජා පාදක සංවිධානවල කොන්ත්‍රාත් පිරිනැමීමට පෙර , මූල්‍ය හැකියාව හා පෙර පලපුරුද්ද පිළිබඳ තොරතුරු ලබාගෙන නොතිබුණි. |

1.3.8 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බලගොල්ල මොරගහපිටිය බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 48 ක් සඳහා 2014 නොවැම්බර් 24 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී තිබූ තක්සේරුව 2015 පෙබරවාරි 26 දිනැති මහා සභාවේදී ඉහළ මහල සඳහා රු.500 ක් හා පහළ මහල සඳහා රු.1,000 ක් වශයෙන් කුලී අය කිරීමට යෝජනා කර කුලී අය කිරීම හේතුවෙන් රු.9,900,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) දිගන බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 32 ක් සඳහා 2014 නොවැම්බර් 24 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලැබී තිබූ තක්සේරු කුලිය අය නොකර 2014 නොවැම්බර් 24 මහ සභාවේදී යෝජනා කරන ලද ගාස්තුව අය කිරීම හේතුවෙන් සභාවට රු.1,908,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.77,794,557.92 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,976,713 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,663,428 | 7,846,617 | 5,751,996 | 4,983,478 | 7,487,520 | 7,931,869 | 57,093,663 | 4,999,325 |
| අක්කර බදු | 7,685 | 6,978 | 936 | 41,570 | 6,885 | 6,847 | 1,310 | 42,855 |
| කඩ කුලී | 6,471,658 | 6,084,477 | 4,248,115 | 1,836,361 | 6,129,373 | 6,627,136 | 5,831,582 | 1,981,846 |
| බලපත්‍ර ගාස්තු | 5,210,000 | - | 6,179,311 | - | 6,330,000 | - | 6,335,981 | - |
| මිශ්‍ර ආදායම් | - | - | 6,144,177 | - | - | - | 9,210,611 | - |
| ත්‍රී රෝද රථ | 442,500 | 973,000 | 474,600 | 1,775,449 | 732,000 | 1,026,781 | 382,144 | 2,211,495 |
| කසළ බදු | 2,142,500 | 2,691,500 | 1,763,400 | 1,730,940 | 2,061,200 | 2,011,200 | 1,318,700 | 1845,240 |
| | 21,937,771 | 17,602,572 | 24,562,535 | 10,367,798 | 22,746,979 | 17,603,833 | 80,173,991 | 11,080,761 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු වත්කම් බදු දීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවාගෙන තිබූ තක්සේරු කඩ කුලිය අය නොකර සභා තීරණ මත කඩ කුලී අය කිරීමෙන් සභා අරමුදලට පාඩු සිදුවී තිබුණි.

(ආ) වරිපනම් බදු වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, 2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත 2017 වර්ෂය දක්වාම වරිපනම් අය කිරීම හේතුවෙන් විශාල ආදායමක් සභාවට අහිමි වී තිබීම හා නව වරිපනම් ඒකක හඳුනා ගැනීමටද නොහැකි වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

--------------------

(අ) වරිපනම්

------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.4,983,478 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.2,206,658 ක් පමණක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කල ආදායම වූ රු.7,846,617 කින් අයකරගෙන තිබුණේ රු.5,751,996 ක් පමණි.

(ආ) අක්කර බදු

--------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.41,570 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අයකර තිබුණේ රු.4,252 ක් පමණි.

(ඇ) කසළ බදු

------------

කසළ බදු ආරම්භක හිඟය රු.1,730,940 ක් වූ අතර, වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.578,200 ක් පමණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,845,240 ක හිඟයක් විය.

2.2.4 කුලී

-------

කඩ කුලී

------------

වර්ෂය ආරම්භයේ කඩ කුලී හිඟය රු.2,378,362 ක් වුවත්, වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර තිබුණේ රු.1,192,070 ක් පමණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

-----------------

වෙළඳ ස්ථාන පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේ දී සිදු නොකිරීම නිසා බලපත්‍ර ගාස්තු නොගෙවූ ආයතන හඳුනාගත නොහැකි විය.

2.2.6 වෙනත් ආදායම්

--------------------

ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟය රු.1,775,449 ක් වූ අතර, වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.208,591 ක් පමණි. වර්ෂයේ බිල් කිරීම් රු.1,026,781 ක් වුවත්, අයකිරීම් රු.382,144 ක් වීම හේතුවෙන් වර්ෂය අවසානයට සම්පූර්ණ හිඟය රු.2,211,495 ක් වැනි ඉහළ අගයක් විය.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,022,004 ක් හා මුද්දර ගාස්තු රු.101,114,749 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රතිපාදන නොසැලසීම

--------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් 6 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම සිදුකර නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා රු.31,564,001 ක මුදලක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍ය | ඇස්තමේන්තු වටිනාකම | ඉටුකළ ප්‍රමාණයේ වටිනාකම | නිරීක්ෂණ |
|---|---|---|---|
| | රු. | රු. | |
| දිගන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | 32,740,807 | 31,564,001 | 2011 වර්ෂයේ ඉදිකර තිබුණු මෙම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 5 ක් නිම කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

පල්ලේකැලේ රජරුපපොළ ඉදිකිරීම සඳහා රු.9,000,000 ක් වැය කර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍යය | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| පල්ලේකැලේ රජරුපපොළ | 9,000,000 | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේකැලේ රජරුපපොළ 2015 දෙසැම්බර් වන විට රුපියල් මිලියන 9 ක වියදමක් දරා ඉදිකිරීම් අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතියේ යෝග්‍යතාවය හඳුනාගෙන නොතිබීම හේතුවෙන් 2016 අගෝස්තු මාසයේ සිට නිෂ්කාර්යව පැවතුණි. |

(ඈ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යන්

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් තුළදී කර්තව්‍යන් 37 ක් ආරම්භ කර ඒ සඳහා රු.3,234,534 ක ප්‍රතිපාදන සලසා ගෙන ඇතත්, ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභා ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ස්වයංක්‍රීය ස්වායු තාක්ෂණික කාබනික පොහොර නිෂ්පාදන කර්මාන්තයෙන් දිනකට පොහොර ටොන් 04 ක් නිෂ්පාදනය කරනු ලැබුවද, පොහොර හලන යන්ත්‍ර 2 ක් පමණක් පවතින බැවින් දිනකට හලන පොහොර ප්‍රමාණය සීමා

වීම නිසා පොහොර විශාල ප්‍රමාණයක් කසළ අංගනය තුළ එකතු වී තිබුණි. නිෂ්පාදනය කරන පොහොර ප්‍රමාණයට සරිලන හලන යන්ත්‍රයක් 2017 වර්ෂයේ දී මිලදීගෙන තිබුණද අධික ශබ්දය හා කාර්යක්ෂම නොවීම නිසා භාවිතයෙන් ඉවත් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී පොහොර නිෂ්පාදනය ගණනය කර නොතිබුණු අතර, පොහොර නිෂ්පාදනයෙන් ලැබී තිබුණේ රු.138,720 ක ආදායමක් පමණි.

(iii) කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා නොගන්නා නොදිරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයට යොමු නොකර පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි.

(ඊ) තිරසාර සංවර්ධන ඉලක්ක

-------------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

කුණ්ඩසාලේ මාළු වෙළඳසැල වර්ෂ කිහිපයක සිට බදු ගෙන තිබූ පුද්ගලයාටම 2017 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝකාලීනව බදු දීමට සභාව කටයුතු කර තිබුණි. දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමේදී එක්වන් මුදල් (key money) අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අදාල ගිවිසුම දින රහිතව අත්සන් තබා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

-------------------------------------

(i) අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී තනතුරු 8 ක සේවක පුරප්පාඩු 17 ක් හා තනතුරු 4 ක සේවක අතිරික්තතා 5 ක් විය.

(ii) ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයෙහි කිසිදු බාහිර රෝගී සායනයක් පවත්වා නොතිබියදී, එහි සේවයෙහි නිරතව සිටි ආයුර්වේද වෛද්‍ය නිලධාරිවරයාට 2016 වර්ෂය සඳහා රු.630,304 ක හා 2017 වර්ෂය සඳහා රු.658,044 ක වැටුප් ගෙවා තිබුණි.

(ආ) සේවක ණය

----------------

2017 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.438,084 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවක ඇප

--------------

සේවක ඇප තැන්පත් ලේඛනයෙහි 2017 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුට අදාළ රු.4,622 ක ශේෂයක් පවතින ඇප තැන්පත් ගිණුම් පොත් අදාළ ආයතනවලට පවරා නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

විදුලි කාර්මික විසින් විදුලි භාණ්ඩ ඉල්ලීම් ලිපි යොමු කර ලිඛිතව බාර ගෙන තිබුණු භාණ්ඩ හා විදුලි භාණ්ඩ ලේඛනය අතර, CFL බල්බ් 89 ක රු.53,940 ක වෙනසක් පැවතුණි.

3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

-----------------------------------

කඩ කාමර බදු දීම සම්බන්ධ 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව වෙළඳපොළ කඩ කාමර බදු දීම සඳහා ගිවිසුම් පත්‍රයෙහි බදු ගැනුම්කරු හා පළාත් පාලන ආයතනයේ සභාපති/ ලේකම් විසින් එකඟතාවයකට පැමිණිය යුතු වුවත්, අදාළ ගිවිසුමෙහි නීතිඥවරයකුගේ අත්සන යොදා එක් ගිවිසුමකට රු.1,000 බැගින් ගෙවීම් කර තිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

------------------------------

3.6.1 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

---------------------------------------------

යමහා වර්ගයේ යතුරු පැදියක් 2018 දෙසැම්බර් 19 දින වන විට අක්‍රීයව කාර්යාල භූමියේ දමා තිබුණි.

3.6.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඩිෆෙන්ඩර් රථයක් 2014 දෙසැම්බර් 11 දින සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාව සතු කඩ කාමර 13 ක් බදුදීමට කටයුතු නොකිරීම නිසා නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2015 ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරමුදල් යටතේ රු.615,820 ක් වැය කර මිලදී ගෙන තිබූ ව්‍යායාම උපකරණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද ප්‍රයෝජනයට නොගෙන සභා කාර්යාලයේ කාමරයක ගොඩගසා තිබුණි.

3.6.3 වාහන උපයෝජනය

-------------------------

(අ) සභාව සතු ට්‍රැක්ටරයක් , හීනෝ වර්ගයේ ලොරියක් හා යතුරු පැදියක් 2017 දෙසැම්බර් 31 දිනට ධාවනයෙන් ඉවත් කර තිබුණද, අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රජවැල්ල නව නගරයේ පිහිටි ඉඩම් කොටසක් ළමා උද්‍යානයක් පවත්වාගෙන යෑම සඳහා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට 2002 අප්‍රේල් 24 වන දින පවරා දී තිබුණ ද, මෙම ඉඩම 2002 වර්ෂයේ සිටම නිෂ්කාර්යව පැවතුණි.

3.7 ආර්ථික නොවූ ගනුදෙනු
------------------------------

සභාව සතු කොම්පෝස්ට් අංගනය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා පුවත්පත් 2 ක සාවද්‍ය තොරතුරු ඇතුළත් කර දැන්වීම පළකිරීම සඳහා 2017 ඔක්තෝබර් මාසයේදී රු.86,940 ක වියදමක් දරා තිබුණි.

3.8 ප්‍රසම්පාදනය
----------------

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------

ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. කමිටු නිලධාරීන් ප්‍රසම්පාදන කමිටුවෙහි තීරණ සඳහා එකඟතාවය පලකරමින් වැඩි තීරණ ප්‍රමාණයක් සඳහා අත්සන් යොදා නොතිබුණි. ඇතැම් තීරණ සඳහා එක් නිලධාරියෙක් හෝ අත්සන් යොදා නොතිබුණි.

3.8.2 සැපයීම් හා සේවා
----------------------

සමාලෝචිත වර්ෂයේදී රු.38,781,297 ක් වටිනාකම වූ කර්මාන්ත 86 ක් ප්‍රජා පාදක සමිතිවලට ලබා දී තිබූ නමුත්, මෙම කර්මාන්ත ඉටු කර තිබුණේ පළාත් සභාවේ හිටපු සභිකවරුන් හා වෙනත් පුද්ගලයන් බව අදාළ සමිතිවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික වරුන්ගේ ප්‍රකාශ වලින් තහවුරු විය.

3.8.3 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

අලුත්වත්ත කොම්පෝස්ට් අංගනය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය
-----------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.20,000,000 ක ප්‍රතිපාදන මත පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ රු.18,418,822 ක මුදලකට 2017 නොවැම්බර් 06 දින ගිවිසුම්ගත වී රු.16,364,652 ක් ගෙවීම් කර තිබුණි.

(අ) මෙම ඉදිකිරීමට අදාළ ගොඩනැගිලි සැලසුම් සකස් කර නොතිබුණි.

(ආ) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 4 අනුව අංගනයේ පස් පුරවා තැලීම සඳහා ඝන මීටරයකට රු.1,036 ක් බැගින් ඝන මීටර 465 ක් සඳහා රු.481,740 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත්, ගෙවීම් කිරීමේදී අතිරේක ඇස්තමේන්තුවක් අනුමත කර නොගෙන මුල් ඇස්තමේන්තුව ඉක්මවා රු.750,212 ක් ගෙවා තිබුණි.

(ඇ) පිටතින් පස් ගෙනවිත් පුරවා තැලීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් කුණු සහිත පස් පුරවා ඝන මීටර 912 කට ඝන මීටරයකට රු.1,350 බැගින් රු.1,231,956 ක මුදලක් සහතික කර ගෙවීම් කර තිබුණි.

(ඇ) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 14:1 ප්‍රකාරව, පාර කොන්ක්‍රීට් කිරීම ඝනමීටර 67.50 ක් ඝන මිටරයක් සඳහා රු.18,792 බැගින් රු.1,268,460 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, මිනුම් පත්‍ර අනුව ඝන මීටර 44.28 ක් සඳහා රු.819,180 ක මුදලක් සහතික කර ගෙවා තිබුණි. නමුත් භෞතිකව අහඹු ලෙස ස්ථාන 3 ක් පරීක්ෂාවේදී එහි ඝනත්වය 6" , 4.5" , 3" ආදී වශයෙන් තිබූ බැවින් කොන්ක්‍රීට් ඝන මීටර් 16.56 ක් සඳහා රු.306,360 ක් ඉටු නොකල වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි.

(ඉ) අතිරේක වැඩ සඳහා රු.860,011 ක වියදමක් දරා ඇතත්, ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඊ) වැඩ විෂය අංක 16 මගින් ගේට්ටුවක් සපයා සවි කිරීම සඳහා අයිතමයක් ලෙස රු.100,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. ගෙවීම් කිරීමේදී මිනුම් පදනම් කර නොගෙන සම්පූර්ණ මුදලම ගෙවීම් කර තිබූ අතර, භෞතික පරීක්ෂාවේදී අඟල් 1 ½ හතරැස් යකඩ හා අමානෝ ෂීට් භාවිතා කර සවි ශක්තියෙන් අඩු ගේට්ටුවක් සවිකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ අතර, මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 8 ක් සඳහා වෙන්කළ රු.785,000 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක් සඳහා වෙන්කළ රු. 5,850,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 4 ක් සඳහා ඇස්තමේන්තුගත රු.700,000 ක ආදායමෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර තිබුණු නමුත් එම නිලධාරියාට වෙනත් රාජකාරි ද පවරා තිබූ බැවින් ප්‍රමාණවත් තරම් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකිවී තිබුණි.

05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | සභාව සතු ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය කර සියලුම වත්කම් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | සභාව සතු ඉඩම් විධිමත් අනුමැතියක් නොමැතිව බාහිර පාර්ශවයන්ට භුක්ති විඳීමට ඉඩ සැලැස්වීම. |
| | | (iii) | සභාව සතු වාහනයක් වසර 4 ක පමණ කාලයක් ගරාජයේ රඳවා තැබීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | සභාව සතු සියලු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | අවසන් පොහොර තොගය ගිණුම්ගත නොකිරීම. |
| | | (iii) | ගිණුම් ශේෂ නිරවුල් නොකර දීර්ඝකාලීනව ඉදිරියට පවත්වාගෙන යෑම. |
| (ඇ) | මුදල් හා බැංකු | (i) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවී පවතින චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| | | (ii) | අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| | | (iii) | හඳුනා නොගත් හර ශේෂ හා බැර ශේෂ හඳුනාගෙන නිරවුල් නොකිරීම. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | කඩ කුලී අය කිරීමට අවධානය යොමු නොකිරීම හේතුවෙන් ඉහළ හිඟයක් පැවතීම. |
| | | (ii) | වෙළඳ බලපත්‍ර පිළිබඳව වර්ෂය ආරම්භයේ විධිමත් සමීක්ෂණයක් සිදු නොකිරීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීම හා ප්‍රජාපාදක සමිති වලට ලබා දුන් සංවර්ධන යෝජනා අසාර්ථක වීම. |
| | | (ii) | ඉදිකිරීම් සම්බන්ධයෙන් අධීක්ෂණය දුර්වල වීම. |
| | | (iii) | ඉදිකිරීම් ලිපිගොනු යාවත්කාලීන නොකිරීම. |